**2023 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි II පරීක්ෂණය (2022/2021/2020/2019) (පුනර්) සහ ශාස්ත්‍රවේදී මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා (සාමාන්‍ය) බාහිර උපාධි II පරීක්ෂණය (2018/2017/2015 පුනර්) - (නව නිර්දේශය) 2026 ජූලි/අගෝස්තු**

**2026 ජූලි 15 දින සිට ආරම්භ වීමට නියමිත උක්ත පරීක්ෂණයට අදාළ විභාග ප්‍රවේශ පත්‍රය මේ වන විට ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) වෙත පිවිස භාගත (Download) කරගත හැක.**

ප්‍රවේශ පත්‍රයේ සඳහන් මධ්‍යස්ථාන කේතය (**Exam Code**) අනුව පහත සඳහන් විභාග මධ්‍යස්ථානය වෙත අදාල විභාගය සඳහා පැමිණිය යුතුය.

| මධ්‍යස්ථාන කේතය | විභාග මධ්‍යස්ථානය |
|---|---|
| 51 | විද්‍යාකර බාලිකා විද්‍යාලය, මහරගම |
| 52 | මහාමායා බාලිකා විද්‍යාලය, නුගේගොඩ |
| 57 | බණ්ඩාරනායක ශාලාව- මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය |
| 101 | භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසාංගික කලා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ |
| 194 | අනුලා විද්‍යාලය, නුගේගොඩ |
| 209 | ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, නුගේගොඩ |
| 214 | ශාන්ත ජෝන් බාලක විද්‍යාලය, නුගේගොඩ |
| 240 | විමලධර්ම මන්දිරය,මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය ,ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ |
| 252 | බුවනෙකබා මහා විද්‍යාලය - මහරගම |
| 271 | Exam Hall No 01 Faculty of Medical Science |
| 273 | බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, අංක 16, එස්.ඩී.එස්. ජයසිංහ මාවත, කොහුවල, නුගේගොඩ |
| 288 | E 523 විභාග ශාලාව (5 වන මහල), කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ |
| 289 | E 524 විභාග ශාලාව (5 වන මහල), කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ |
| 230 | SBSF ශාලාව (2 මහල ) කළමනාකරණ අධ්‍යයන හා වාණිජවිද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ |

සැලකිය යුතුයි :

- ඔබගේ බාහිර අපේක්ෂක සටහන් පොතේ සඳහන් අත්සන සහ විභාග ප්‍රවේශ පත්‍රයට යොදන අත්සන සමාන විය යුතු අතර එසේ නොවුනහොත් එය විභාග අක්‍රමිකතාවයක් සේ සලකනු ලැබේ.

Important :

- Signature placed on your record book should be tally with the signature which used for the Admission card. If not it will be an examination offence.

## අපේක්ෂකයන් සඳහා  පොදු උපදෙස්

- **පරීක්ෂණය සඳහා සහභාගී වීමේදී අත්සන සහතික කරන ලද විභාග ප්‍රවේශ පත්‍රය සහ ශිෂ්‍ය වාර්තා පොත රැගෙන පැමිණීම අනිවාර්ය වන අතර එසේ නොමැති අපේක්ෂකයන්ට පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.**

- පරීක්ෂණය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම විභාග ප්‍රවේශ පත්‍රයේ සඳහන් විභාග මධ්‍යස්ථානයට පැමිණිය යුතුය.

- විභාග ප්‍රවේශපත්‍රයට යොදන අත්සන ඔබගේ බාහිර අපේක්ෂක සටහන් පොතේ අත්සනට සමාන විය යුතුය. එසේ නොවුනහොත් එය විභාග අක්‍රමිකතාවයක් සේ සලකනු ලැබේ.

- විභාගය සඳහා පෙනී සිටින අවස්ථාවේදී ඔබට හදිසි රෝගී තත්ත්වයක් ඇතිවුවහොත් වහාම විභාග නිරීක්ෂක නිලධාරියෙකුට හෝ විභාග ශාලාධිපතිට දැන්විය යුතුය.

- **විභාග අපේක්ෂකයන්ගේ දෙමාපියන් හෝ භාරකරුවන් විභාග මධ්‍යස්ථානය අසලට පැමිණීමෙන් වැළකිය යුතු අතර පරිශ්‍රය තුළට කිසිදු වාහනයක් ඇතුළු නොකළ යුතුය.**

- විභාග මධ්‍යස්ථානය තුල විභාග ශාලාවලින් පිටත වෙනත් පරිශ්‍රවලට අනවශ්‍ය පරිදි ගමන් කිරීමෙන් වැළකිය යුතුය.

- විභාග මධ්‍යස්ථාන පරිශ්‍රය තුළ අපද්‍රව්‍ය බැහැර කිරීමට පහසුකම් සලසා ඇති ස්ථානයට හැර වෙනත් කිසිදු ස්ථානයට අපද්‍රව්‍ය බැහැර නොකල යුතුය.

## බාහිර උපාධි පරීක්ෂණ සඳහා නොපැමිණීමට හේතු/වෛද්‍ය වාර්තා/Absence Justification Form ඉදිරිපත් කිරීම සඳහා උපදෙස්

1. මෙම පරීක්ෂණය සඳහා පළමුවර පෙනී සිටින 2023/2024 ශිෂ්‍ය කණ්ඩායමේ අපේක්ෂකයන්ට සහ 2022/2023 අධ්‍යයන වර්ෂයේ II පරීක්ෂණය සඳහා වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර අනුමත වූ අපේක්ෂකයන්ට (ප්‍රතිඵල ලේඛනයේ MC සහිත) පමණක් මෙවර පරීක්ෂණයට පෙනී නොසිටියේ නම් පහත පරිදි වෛද්‍ය වාර්තා ඉදිරිපත් කළ හැකිය. පහත දක්වා ඇති 428 සනාතන සභාව විසින් අනුමත කරන ලද කරුණු හොඳින් කියවා මුලු විභාගය හෝ අදාළ විභාග කොටස නිම වී **දින 14 ක් ඇතුළත** වෛද්‍ය වාර්තා ඉදිරිපත් යුතුය. වෛද්‍ය වාර්තා ඉදිරිපත් කිරීම සඳහා විභාගය සඳහා අයදුම් කර තිබිය යුතුය

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ**

**428 වැනි සනාතන සභාව විසින් අනුමත කරන ලද විශේෂ කරුණු**

**බාහිර අපේක්ෂකයන් සඳහා**

- රෝගී තත්ත්වයක් නිසා මුලු විභාගය හෝ විභාගයේ අදාළ කොටසකට හෝ පෙනී නොසිටින බාහිර විභාග අපේක්ෂකයන් එම හේතුව සනාථ කරමින් සාක්ෂි සමග තමා පදිංචි ප්‍රදේශයේ රජයේ ආරෝග්‍ය ශාලාවකින් ලබා ගත් වලංගු වෛද්‍ය සහතිකයක් පෙනී සිටීමට නොහැකි වූ මුළු විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී **දින 14ක් ඇතුළත** බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

- පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන රජයේ පිළිගත් බටහිර, ආයුර්වේද හෝ හෝමියෝපති වෛද්‍යවරුන්ගෙන් ප්‍රතිකාර ලබාගන්නා අපේක්ෂකයෙකු තමා ලබාගත් වෛද්‍ය සහතිකය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී හමු වී ඔහු ලවා සහතික කරවා ගත යුතු ය. එම සහතිකය පෙනී සිටීමට නොහැකි වූ විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී **දින 14ක් ඇතුළත** බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

2. බාහිර උපාධි පරීක්ෂණ සඳහා නොපැමිණීමට හේතු /වෛද්‍ය වාර්තා/Absence Justification Form ඉදිරිපත් කිරීමට අපගේ LMS සහ Student Profile හි ඇති අයදුම්පත (සිංහල හෝ ඉංග්‍රීසි යන ඕනෑම මාධ්‍යයකින් ) බාගත කරගෙන නිවැරදිව සම්පූර්ණ කර වෛද්‍ය වාර්තාව සමග අමුණා **"නියෝජ්‍ය ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, නො.16 ,** එස් ද එස් ජයසිංහ මාවත **,**කොහුවල නුගේගොඩ**.** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ සතියේ දිනවල කාර්යාල වේලාවන්හි (පෙ.ව 8.30- ප.ව. 4.15) ගෙනවිත් භාරදීම සිදුකළ යුතුය. (ඡායා පිටපත් ළඟ තබාගන්න) වෙනත් කිසිදු අකාරයකින් භාරදීම සිදු නොකළයුතුය

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2026.07.10